මගේ අංකය : JSC/SEC/CIR/2022

**සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ අධිකරණ නිලධාරීන් වෙත,**

**සැක කටයුතු ලේඛන පිළිබඳ අංශයේ දෛනික නඩු භාණ්ඩ භාරගැනීම තාවකාලිකව අත්හිටුවීම පිළිබඳ දැන්වීමයි**

ශීර්ෂගත කරුණට අදාලව ආණ්ඩුවේ රස පරීක්ෂක - ජී.රමනා මහත්මිය විසින් මටද පිටපතක් සහිතව පොලිස්පති අමතා ඇති අංක. GAD/AD-05/COVID-19 හා 2022.01.26 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එම ලිපියෙහි සඳහන් කරුණු ඔබගේ අවධානයට යොමු කරන ලෙස මට නියම කර ඇත.

02. අදාල ලිපියෙහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2022 පෙබරවාරි මස 08 වන දින

කොළඹ 12

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
அரசாங்க இரசாயனப் பகுப்பாய்வாளர் திணைக்களம்
GOVERNMENT ANALYST'S DEPARTMENT

අංක 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල.
இல. 31, இசுறு மாவத்தை, பெலவத்த, பத்தரமுல்ல.
No. 31, Isuru Mawatha, Pelawatta, Battaramulla.
SRI LANKA.

දුරකථන / தொலைபேசிகள் / Telephones: 011 - 2786395, 011 - 2176800
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2786394
*E-mail* : govanalyst@sltnet.lk

මගේ අංකය / எனது இல. / My No.: GAD/AD-05/COVID-19
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2022.01.26

පොලිස්පති,
පොලිස් දෙපාර්තමේන්තුව,
කොළඹ 01.

<u>සැක කටයුතු ලේඛන පිළිබඳ අංශයේ දෛනික නඩු භාණ්ඩ භාරගැනීම තාවකාලිකව අත්හිටුවීම පිළිබඳ දැන්වීමයි.</u>

රට තුල කෝවිඩ් වෛරසය සීග්‍රයෙන් පැතිරෙමින් පවතින අතර, මෙම දෙපාර්තමේන්තුවේද සැක කටයුතු ලේඛන පිළිබඳ අංශයේ (EQD) සහ ධූලක විද්‍යා අංශයේ (CT) නිලධාරීන් රැසක් කෝවිඩ් ආසාදිතයන් ලෙස හදුනාගෙන ඇත. එම නිලධාරින්ගේ සමීප ආශ්‍රිතයන් රැසක් ස්වයං නිරෝධායනයටද ලක්කර ඇත.

2. දෛනිකව දෙපාර්තමේන්තුවට නඩුභාණ්ඩ රැගෙන, පොලිස් නිලධාරින් මෙන්ම සෞඛ්‍ය අංශයේ නිලධාරින්ද විශාල වශයෙන් පැමිණෙන අතර, නඩු භාණ්ඩ භාර ගැනීම තුලින් තවදුරටත් වෛරසය පැතිරීමේ ඉඩකඩ අධිකය. එවැනි තත්වයක් උද්ගත වුවහොත් දෙපාර්තමේන්තුව මුලුමනින්ම වසා දැමීමට සිදුවීමේ දැඩි අවධානමක් පවතී.

3. මෙම තත්වය සම්බන්ධයෙන් සෞඛ්‍ය අංශයේ අදහස් ද සැලකිල්ලට ගෙන, නඩු භාණ්ඩ විශ්ලේෂණ කටයුතු අඛණ්ඩව පවත්වා ගනිමින් සැක කටයුතු ලේඛන පිළිබඳ අංශයේ සහ ධූලක විද්‍යා අංශයේ නඩු භාණ්ඩ භාර ගැනීම පමණක් 2022.01.25 දින සිට සතියක් ගත වනතුරු තාවකාලිකව නතර කිරීමට දෙපාර්තමේන්තුව විසින් තීරණය කරන ලදී. (එසේ වුවද ජාතික වැදගත් කමකින් යුත් සහ ඉතා හදිසි නඩු භාණ්ඩ පමණක් භාර ගැනිමට කටයුතු කරනු ඇත.)

4. මේ පිළිබඳව දිවයිනේ සියලු පොලිස් ස්ථාන දැනුවත් කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

**ජී.රමනා**
**ආණ්ඩුවේ රස පරීක්ෂක**

පිටපත: 1. ලේකම්, අධිකරණ අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
2. ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
3. නීතිපති, නීතිපති දෙපාර්තමේන්තුව - කරු. දැ.ගැ.ස.
4.සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - සෞඛ්‍ය අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
5. අජිත් ජයසේන මහතා, විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරී - කරු.දැ.ගැ.ස.